**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017**

**SOC 1202 – මනෝ විද්‍යාවේ මූලධර්ම**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**
**සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

---

1. ව්‍යුහවාදය හා කෘත්‍යවාදය තුළ මනසට දී ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

2. මනෝවිද්‍යාවේ යොදා ගනු ලබන විවිධ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කර, ඉන් එක් ක්‍රමයක් උදාහරණ සහිතව විස්තර කරන්න.

3. <u>එක්කෝ</u>

   ස්නායු පද්ධතියේ ව්‍යුහය කෙටියෙන් විස්තර කර එහි කෘත්‍යයන් පැහැදිලි කරන්න.

   <u>හෝ</u>

   මිනිසාගේ පැවැත්මට අභිප්‍රේරණය (motivation) උපකාරී වන්නේ කෙසේදැයි මාස්ලෝගේ මනෝ විද්‍යාත්මක න්‍යාය ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

4. රාත්‍රියේදී ඔබ නිවසේ තනි වී සිටින අවස්ථාවකදී අකුණු ගසමින් විදුලි කොටයි. හදිසියේම විදුලි බලය විසන්ධි වන අතර කිසිවෙකු නිවසේ දොර විවෘත කිරීමට උත්සාහ කරනු ඔබට ඇසේ. මෙම අවස්ථාව පැහැදිලි කිරීමට ජේම්ස් - ලැනගේ හා කැනන් - බාර්ඩ්ගේ න්‍යාය සහාය වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

5. ඉගෙනීම, පරිසරය සමඟ සිදුවන අන්තර් ක්‍රියාව හරහා චර්යාව තුළ සාපේක්ෂ වශයෙන් ඇතිවන ඕනෑම ස්ථිර වෙනසක් ලෙස නිර්වචනය වේ. මෙම ප්‍රකාශය සම්භාව්‍ය තත්ත්වාරෝපණය පිළිබඳ සම්පරීක්ෂණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

අ.පි.බ.

6. පෞරුෂය පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ න්‍යාය මනෝ සමාජ සංවර්ධන අවධි ඇසුරින් පැහැදිලි කරන්න.

7. සංජානන පද්ධතියේ කෘත්‍යයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

8. 'ස්මෘතිය (memory) මෙන්ම අමතක වීම ද මිනිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයට එක හා සමානව වැදගත් වේ.' මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

**************